www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුරුමය තුල ජාත්‍යන්තර මැදිහත් වීමකට ප්‍රචාරක උද්ඝෝෂනය කුමක් සඳහා ද?

## Why the propaganda campaign for international intervention in Burma?

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2008 මැයි 10**

නර්ගිස් සුළි සුළඟ මගින් බුරුම ජනතාව මත ඇති කල විනාශය මිලිටරි ජුන්ටාව විදේශ ආධාර සහ ආධාර කන්ඩායම්වල නිලධාරින්ට මෙන් ම ඇමරිකානු මිලිටරි ගුවන් යානා, හමුදා බල ඇනි සහ යුද නැව්වලට එහි දේශ සීමා විවෘත කල යුතු බව ඉල්ලමින් එක්සත් ජනපදය සහ එහි සහායක බලයන් විසින් සහ ජාත්‍යන්තර මාධ්‍ය තුල අත්‍යඅසාමාන්‍ය උද්ඝෝෂනයක් ප්‍රකුපිත කර තිබේ.

ආධාර ලබාදීම සඳහා ප්‍රමානවත් උත්සාහයක් නැතිකම, පටු මානසිකත්වය සහ ජාත්‍යන්තර, විශේෂයෙන් ම ඇමරිකානු ආධාර පිලිගැනීමට අසමත් වීම ගැන බුරුම පාලන තන්ත්‍රයේ හෙලා දැකීම නිරන්තර හඬතැලීමත් සමග බද්ධ වූ අමාරුවෙන් දිවිගලවා ගත්තවුන්ගේ සහ විනාශභාග්‍ය්වූ නගරවල හද කම්පාකරවන දර්ශන සහිතව නැවත වරක් මහජන මතය ඇවිස්සීමේ උත්සාහයක යෙදීගෙන සිටිති.

යමෙක් වහාම මඳකට නතර වී මේ හා සමාන "මානවහිතවාදී" අභ්‍යාසයන්ගේ ප්‍රතිවිපාක ගැන මතකයට නගාගත යුතු ය. එක්සත් ජනපදය සහ එහි සගයන් විසින් 1999දී සර්බියාවට එරෙහිව යුද්ධය දියත් කිරීම සඳහා කොසෝවෝවේ සරනාගතයන්ගේ තත්වය ගසා කෑ අතර එහි සර්බියන් සුලුතරය විශාල වශයෙන් "සුද්ධකර" ප්‍රාන්තය නේටෝවේ යටත් ප්‍රදේශයක් බවට පරිවර්තනය කලේ ය. එම වසරේදී ම එක්සත් ජනපදයේ පිටුබලය ලත් ඕස්ට්‍රේලියාව කැන්බරාවේ ආර්ථික සහ මූලෝපායාත්මක අවශ්‍යතාවයන්ට හිතවාදී තන්ත්‍රයක් පිහිටුවීම සඳහා නැගෙනහිර ටිමෝරය තුලට මිලිටරි මැදිහත්වීමක් කිරීම යුක්ති සහගත කිරීමට ඉන්දුනිසියාවේ පිටුබලය ලත් සන්නද්ධ කන්ඩායම්වල ප්‍රචන්ඩ ක්‍රියා යොදා ගත්තේ ය. දශකයකට ආසන්න කාලයකට පසුව රටවල් දෙකේ ම ජනතාව ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් කිසිවක් සාක්ෂාත් වීමකින් තොරව අතිශයින්ම කටුක කොන්දේසි යටතේ දිවි ගෙවති.

නිසැකව පසුගිය සතියෙහි සුවිසල් ඛේදවාචකයක් සිදු විය. බුරුමයේ නිල සංඛ්‍යා ලේඛනවලට අනුව 60,000 වැඩි සංඛ්‍යාවක් මරනයට පත්ව සහ අතුරුදහන්ව සිටිති. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තක්සේරු කිරීම්වලට අනුව ලක්ෂයක් මරනයට පත් වී ඇති අතර සුළි සුළඟින් 200,000 ආසන්න සංඛ්‍යාවකට බරපතල හානි සිදු වී තිබේ. පහත්බිම් යට කර ගෙන හමා ගිය නාර්ගිස් සුළි සුළඟ විසින් ඇති කල කුනාටුවෙන් දැවැන්ත ඉරවඩ්ඩි ඩෙල්ටාවෙන් විශාල පදාසයක් විනාශ වී ඇත. ඉන්දුනිසියාවේ, ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ වෙරලබඩ ප්‍රදේශවල 2004 දෙසැම්බර් සුනාමිය විසින් ඇති කල විනාශය මතකයට නංවමින් සම්පූර්න නගර සහ ගම් සෝදා ගෙන ගොස් ඇත.

බුරුම ජුන්ටාව තමන්ගේ බලය සහ වරප්‍රසාද රැක ගැනීම සඳහා විරෝධතාකරුවන්ට යලි යලිත් වෙඩි තැබූ මෘග පාලන තන්ත්‍රයක් බව ද සත්‍යයකි. විපතට පත්වූවන් මුදාගැනීමේ එහි උත්සාහයන් අසාර්ථක වී ඇත්තේ රටේ ආර්ථික පසුගාමිත්වය නිසා පමනක් නොව, බුරුම මහජනතාවගේ තත්වය පිලිබඳව දුෂ්ට නොතැකීම ද නිසාවෙනි. වර්තමාන මාධ්‍ය උද්ඝෝෂනය නිසා, යමෙකු සියලු ම මාධ්‍ය වාර්තාවලට ප්‍රවිෂ්ට විය යුත්තේ තරමක් ප්‍රවේශමෙන් ය. නමුත් 2004 සුනාමියෙන් දිවි ගලවගත්තවුන් සම්බන්ධයෙන් සුනාමියට බරපතල ලෙස පහර කෑ රටවල ආන්ඩු කල ආකාරයට සුළි සුළඟින් විපතට පත්වූවන් ඔවුන්ගේ ම ඉරනමට අතහැර දැමීම ගැන සැකයක් නැත.

බුෂ් පාලන තන්ත්‍රය සහ එහි සගයන්ගේ විපතට පත්වූවන් කෙරෙහි සැලකිලිමත්වීමේ විරෝධතාවයන් කෙරෙහි කිසිවෙකුත් විශ්වාසයක් නොතැබිය යුතු ය. සුළි සුළඟින් විපතට පත්වූවන් සඳහා වොෂින්ටනයේ ආධාර "දේශපාලනය පිලිබඳ ප්‍රශ්නයක්" නොව "මානුෂික අර්බුදයට ප්‍රශ්නයක්" යැයි එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලිසා රයිස් බදාදා පැවසුවාය. "බුරුම ආන්ඩුවට ඉතිරිව ඇත්තේ එහි ජනතාවට උදව් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවට ඉඩ දීම යැයි" ඇය ප්‍රකාශ කලාය.

යථාර්ථයේදී, සියලු ම ඇමරිකානු ආධාර එන්නේ දේශපාලන නූල්වලට ගැටගැසීලා ය. බුෂ් පරිපාලනය ඩොලර් මිලියන 3.5 තරම් නොවටිනා මූල්‍ය

ආධාරයක් පිරිනමමින් බුරුම බලධාරින්ට හදිසි සහන සැලසීමේ කටයුතු පවත්වාගෙන යාමේ ඉඩ නොදී එක්සත් ජනපද නිලධාරින්ට, සහන සේවකයන්ට සහ මිලිටරි නිලධාරින්ට රට තුලට ඇතුල්වීමට ඉඩ සලසන ලෙස බලකරමින් සිටියි. ඒ සමග ම එක්සත් ජනපදය හා එහි යුරෝපීය සගයෝ රටේ ආර්ථික දුෂ්කරතා සංකීර්න වී ඇති බුරුම පාලන තන්ත්‍රයට එරෙහිව ආර්ථික සම්බාධක දිගට ම පවත්වාගෙන යති. සුලි සුලඟට සතියකට පෙර, බුෂ් පරිපාලනය වෙලඳම සහ ආයෝජනය සහ වත්කම් සම්බන්ධව පවත්වාගෙන යන තහනම ශක්තිමත් කලේ ය. මූල්‍ය ආධාර සම්බන්ධව සම්බාධක කෙරෙහි සුලු ලිහිල් කිරීමක් හැරුනවිට අනෙක් සියලු ම තහංචි ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වෙයි.

ජුන්ටාවේ අනුමැතිය ඇතිව හෝ නැතිව බුරුමයේ ජාතික ස්වාධිපත්‍යය නොතකා ජාත්‍යන්තර ආධාර බෙදීමට ඉඩ සලසන "ආරක්ෂා කිරීමේ වගකීම" ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය කැඳවන ලෙස බදාදා ප්‍රන්ස විදේශ ඇමති බර්නාඩ් කෞච්නර් යෝජනා කලේය. 1999 යුගොස්ලොවියාවට එරෙහි යුද්ධය දක්වා ආපස්සට දිවෙන ඉතිහාසයක් ඇති "ආරක්ෂා කිරීමේ වගකීම" පිලිබඳ යෝජනාව "සමූලඝාතන, යුද්ධ, වාර්ගික සුද්ධකිරීම් සහ මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ වැලැක්වීමේ පදනම මත" කෙරෙන මිලිටරි ආක්‍රමන යුක්ති සහගත කිරීමේ උපකරනයකි. නාර්ගිස් සුලි සුලඟ වැනි ස්වාභාවික විපතක් දක්වා එබඳු මැදිහත්වීම් කිරීමට ඉඩ සලසා ගැනීමක් කෞච්නර්ගේ යෝජනා මගින් ඇඟවුම් කෙරෙයි.

කෞච්නර්ගේ ඇඟවීම්වලට එක්සත් ජනපදය විසින් තවමත් ප්‍රසිද්ධියේ සහාය දී නැතිමුත් යෝජනා පැහැදිලිව බුරුම පරිපාලනය තුල සාකච්ඡාවට භාජනය කරන ලැබ තිබේ. ජාත්‍යන්තර ආධාර පිලිගැනීමට බුරුම පාලන තන්ත්‍රයේ මන්දගාමිකම විසින් බොහෝ ආන්ඩු "කෝපයට" පත් වී සිටින බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එක්සත් ජනපද තානාපති සල්මේ කලිල්සාද් ප්‍රකාශ කලේ ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මන්ඩලයට ඇති බලතල පිලිබඳ ඉඟි කරමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය. "එහි ජනතාව ආරක්ෂා කිරීමට සහ අවශ්‍ය දෑ සංවිධානය කිරීමට ආන්ඩුවකට වගකීමක් තිබේ.... ජාත්‍යන්තර ප්‍රජාව විසින් ප්‍රදානය කරන දේවල් පිලිගැනීමට අකමැතිවන්නේ මුග්ධයෙකි.

විදේශ ආපදා සහන පිලිබඳ එක්සත් ජනපද කාර්යාලයේ අධ්‍යක්ෂ කී ලූ වඩාත් විවෘත ය. ඇමරිකානු ආධාර පිලිගැනීමට ජුන්ටාව දිගට ම ප්‍රතික්ෂේප කරන්නේ නම් එක්සත් ජනපද මිලිටරි ගුවන්යානා මගින් ඒකපාර්ශිකව, ඒවා හෙලීම සැලකිල්ලට භාජනය කරනු ලබමින් ඇති බවට ඔහු ඉඟි කලේය. එක්සත් ජනපද යුද නෞකා දැනටමත් බුරුමය දෙසට ගමන් කරමින් තිබෙන අතර නාවික හමුදාවේ හෙලිකොප්ටර් සහ ගුවන් හමුදාවේ භාන්ඩ ප්‍රවාහන ගුවන් යානා අසල්වැසි තායිලන්තයේ නතර කර තිබේ. බුරුමයේ අවසරයකින් තොරව මිලිටරි මැදිහත් වීමක් සිදු වෙතැයි තමන්ට උපකල්පනය කල නොහැකි බව එක්සත් ජනපද ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක බ්‍රයන් වයිම්බන් සඳහන් කලේ ය. "ඔබ ඇසුවේ නැතිනම් හෝ ඔබගෙන් ඉල්ලා සිටින්නේ නැති නම් එය ආක්‍රමනයක් ලෙස සලකනු ලබයි." එසේ වුවත්, මිලිටරි තෝරා ගැනීම් සහ එහි අප්‍රිය ජනක දේශපාලනික ප්‍රතිවිපාක ක්‍රියාශීලීව සාකච්ඡාවට භාජනය කරනු ලැබ ඇත.

## ආසියානු සුනාමිය

බුරුම ජුන්ටාව මත පීඩනය යෙදීමේ කොටසක් ලෙස සම්බන්ධ වූ සියලු ම පාර්ශවයන් විසින් වේගවත්, කාර්යක්ෂම, සහ සානුකම්පික ආදර්ශයක් ලෙස ආසියානු සුනාමිය කෙරෙහි ජාත්‍යන්තර ප්‍රතිචාරය පින්තාරු කිරීම සඳහා නව ජනප්‍රවාදයක් නිර්මානය කරනු ලැබ තිබේ. වර්තමාන බුරුම තන්ත්‍රය හා 2004 දී එහි "ප්‍රජාතන්ත්‍රවාදී" සමපාර්ශවකරුවන් වන ඉන්දුනිසියාව, ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ තායිලන්තය අතර ප්‍රභේදයන් වඩ වඩා නිර්මානය කරනු ලබමින් ඇත.

එහෙත් 2004 ඛේදවාචකය පිලිබඳ කවර හෝ වෛශයික පරීක්ෂා කිරීමක් සම්පූර්නයෙන්ම වෙනස් පින්තූරයක් එලිදරව් කරයි. දැවැන්ත සුනාමි රල පහර විසින් දෙසැම්බර් 26 බෙංගාල බොක්ක අවට දරිද්‍රතාවයෙන් යුක්ත ගම්මාන වෙලා ගත්තේ ය. මරන සංඛ්‍යාව දස දහස් ගනනින් ඉහල නගිද්දී ඇමරිකානු ජනාධිපති බුෂ්, බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් සහ සෙසු ලෝක නායකයෝ දින ගනනාවක් ගතවන තුරු සිදු වූ ව්‍යසනය ගැන කිසිදු ප්‍රකාශයක් කිරීමට අසමත් වූහ. අවසානයේ ඔවුන්ගේ නිවාඩුව අවසන්වීමෙන් පසුව ඔවුන්ගේ කරන්නන්වාලේ කරන ප්‍රකාශ සහ නොවටනා ආධාර සැපයීම් ව්‍යසනයට ගොදුරු වූවන් කෙරෙහි ඔවුන්ගේ සාමූහික පිලිකුල එලිදරව් කලේය. එක්සත් ජනපදය සහ ප්‍රධාන බලයන් ක්‍රියාත්මක වීමට පටන් ගත්තේ, ව්‍යසනයේ රෞද්‍රතාවයෙන් සන්ත්‍රාසයට පත් ලොව පුරා වැඩ කරන ජනයාගේ අනුකම්පාව හා ආධාර ගලා ඒම ආරම්භ වීමෙන් පසුව පමනි.

බරපතල ලෙස බලපෑ රටවල හදිසි සහන බෙදාහැරීමේ උත්සාහයන් දේශීය සහ ආධාර දෙන රටවල්වල නෛතික සීමාවන් සහ දේශපාලන න්‍යායපත්‍ර මගින් වලකනු ලැබීය. බෙදුම්වාදී ව්‍යාපාරවලට එරෙහි දිගුකාලීන මෘග යුද්ධයක් ගෙන යමින් සිටින ඉන්දුනිසියාව සහ ශ්‍රී ලංකාව විදේශ හමුදාවලට ඉඩ නොදීම පසෙකින් තැබුවත් ව්‍යසනයට

පත් ප්‍රදේශවලට ඇතුලු වීමට අවසර දීමට අතිශයින්ම මැලි විය. විපතට ගොදුරු වූවන්ට සහන සලසනවා වෙනුවට ඉන්දුනිසියානු මිලිටරිය අචේ කැරලිකරුවන්ට එරෙහි යුද්ධය තීව්‍ර කිරීමට එය අවස්ථාවක් කර ගත්තේ ය. ශ්‍රී ලංකාවේදී, බෙදුම්වාදීන් කවර හෝ නිල පිලිගැනීම කෙරෙහි කටුක වාර්ගික අන්‍යොන්‍ය දොස් පවරා ගැනීම මධ්‍යයේ 2002 සටන් විරාම ගිවිසුම යටතේ දෙමල විමුක්ති කොටි සංවිධානය සමග ඒකාබද්ධ මන්ඩලයක් තහවුරු කිරීමේ උත්සාහයන් බිඳවැටුනේය.

තමන්ගේ සහන මෙහෙයුම් තමන්ට පාලනය කර ගත හැකි බව අවධාරනය කල ඉන්දියාව විදේශ මිලිටරි මැදිහත් වීමක් පිලිබඳ කවර හෝ යෝජනාවක් ප්‍රතික්ෂේප කලේය. මූලෝපායාත්මක නාවික සහ ගුවන් හමුදා කඳවුරු තිබෙන හෙයින් සුනාමියෙන් තදින් ම පහර කෑ අන්දමන් හා නිකොබාර් දූපත්වලට ජාත්‍යන්තර ආධාර දෙන කන්ඩායම්වල සේවකයන් ඒවාට ඇතුල්වීම කෙරෙහි ඉන්දියාව අතිශයින්ම සංවේදී වූයේ ය. වසර තුනකටත් වඩා ගතවීමෙන් පසුවත් ඉන්දියාවේ, දූපත්වල සහ රටේ සෙසු කොටස්වලත් ඉන්දුනිසියාවේ සහ ශ්‍රී ලංකාවේත් සුනාමියෙන් විපතට පත් වූ දහස් ගනනක් තවමත් පහසුකම්වලින් තොර තාවකාලික නිවහන්වල ජීවත් වෙති.

ඉන්දියානු ස්වාධිපත්‍යය උල්ලංඝනය කල යුතු යයි අන්දමන් සහ නිකොබාර් දූපත්වලට ඒක පාර්ශවික ගුවනින් ආධාර දැමිය යුතු යැයි එක්සත් ජනපදය හෝ යුරෝපයේ පාලක කල්ලි මේ මොහොතේ යෝජනා කරන්නේ නැත. ශ්‍රී ලංකාවේ දී සහ ඉන්දුනිසියාවේ දී අන්තිමේදී එක්සත් ජනපද හමුදාවට ඒවායේ දේශසීමාවල ආධාර බෙදීමේ මෙහෙයුම්වල යෙදීමට අවසර දුන්නේ ය. වොෂින්ටනයේ ඒකායන දේශපාලනික අරමුන වූයේ රටවල් දෙකේ හමුදා අතර එකට වැඩ කිරීමේ වඩා සමීප සබඳතා ගොඩ නැගීම මෙන්ම දැන් බුරුම ජුන්ටාව මත පීඩනය යොදනු ලබන ආකාරයට පූර්වාදර්ශයක් දීමය.

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් රයිස් සුනාමිය "එක්සත් ජනපද ආන්ඩුවේ පමනක් නොව ඇමරිකානු මහජනතාවගේ හදවත පෙන්වීමේ විශ්මය ජනක අසථාවක් විය. එය අපට බොහෝ ලාභාංශ ගෙවා ඇතැයි" විදේශ සම්බන්ධතා පිලිබඳ කමිටුවට 2005 ජනවාරියේ දී කෙලින්ම ප්‍රකාශ කලාය. බුරුමයට දෙන ආධාර "දේශපාලනය සම්බන්ධ කාරනයක් නෙමෙයි" නමුත් බුෂ් පරිපාලනය කලාපය තුල එහි මූලෝපායාත්මක සහ ආර්ථික අවශ්‍යතා ඉස්මත්තට ගැනීමේ නව දේශපාලන "අවස්ථාවක්" බවට මෙම මෑතම ව්‍යසනය පරිවර්තනය කිරීමට අදහස් කරන බව රයිස් දැන් ප්‍රකාශ කරන්නී ය.

මූලෝපායාත්මක උත්සුකතා

එක්සත් ජනපදයෙන් නොව; චීනය, ඉන්දියාව, තායිලන්තය වැනි තෝරා ගත් හිතවත් රටවලින් ආධාර ලබා ගැනීම බුරුම ජුන්ටාව තීන්දු කිරීම පුදුමයක් නොවේ. බුරුමය තුල "පාලන තන්ත්‍රය වෙනස් කිරීම" ට බුෂ් පරිපාලනයේ ඇති පක්ෂපාතීත්වය රහසක් නොවේ. අවුන් සාන් සූ කී විසින් නායකත්වය දෙන ආන්ඩුවත් මගින් මිලිටරි තන්ත්‍රය විස්ථාපනය කිරීම වොෂින්ටනයේ අවශ්‍යතාවලට සහ විදේශ ආයෝජන සඳහා රට විවෘත කිරීමේ දී වඩා හිතකරය.

ජුන්ටාව පිලිබඳ එක්සත් ජනපදයේ ඉලක්කයට බුරුම ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ සුබ සාධනය සමග මොන ම සම්බන්ධයක් වත් නැත. අන් සියල්ලටමත් වඩා බුරුම පාලන තන්ත්‍රය කෙරෙහි වොෂින්ටනයේ විරුද්ධත්වයට හේතු වී ඇත්තේ එක්සත් ජනපදයේ ප්‍රධාන ප්‍රතිවාදී බලයක් ලෙස සලකන චීනය සමග බුරුම පාලන තන්ත්‍රයට පවතින සමීප සම්බන්ධතාවය යි. පසු ගිය අට වසර පුරා, දකුනු කොරියාව සහ ජපානයේ සිට පිලිපීනය, ඕස්ට්‍රේලියාව සහ ඉන්දුනිසියාවත්, ඉන්දියාව, පකිස්ථානය සහ ඇෆ්ගනිස්ථානයත්, මධ්‍යම ආසියාවේ සමූහාන්ඩුත් සම්බන්ධ කරගත් මිලිටරි සම්බන්ධතා ශක්තිමත් කිරීමේ සහ කඳවුරු පිහිටුවීමේ මූලෝපායත් බුෂ් පරිපාලනය විසින් පවත්වා ගෙන ගොස් තිබේ. චීනය "මෙල්ල කිරීමේ" එක්සත් ජනපද ප්‍රයත්නයේ දී බුරුමය වැදගත් තැනක් දරා සිටියි. බුරුමය පිහිටා ඇත්තේ බලශක්ති සම්පත් බහුල මැද පෙරදිග සහ අප්‍රිකාව සහ චීනය ඇතුලු ඊසාන දිග ආසියාව යා කෙරෙන මුහුදු මාර්ගයේ මූලෝපායාත්මක වැදගත්කමක් සහිත මලක්කා සමුද්‍ර සන්ධිය ආසන්නයේ ය. එවන් "මලපුඩු" පාලනය කිරීම දිගු කලක සිට ම ඇමරිකානු නාවික සැලසුම්වලට කේන්ද්‍රගතව පවතී. විවිධ නාවික පහසුකම් ගොඩනැගීමේදී චීනය බුරුමයට උපකාර කර ඇති අතර, තමන්ගේ ආර්ථිකයට වැදගත් වන නාවික ගමන් මාර්ග ආරක්ෂා කිරීමේ උත්සාහයන්හි කොටසක් ලෙස බුරුම වරායවලට පිවිසීමට ඉඩ සලසා ගැනීමට ද බලාපොරොත්තු වෙයි.

ජාත්‍යන්තර ආධාරවලට ඉඩ ලබා දීමට එහි සගයා පෙලඹවීම සඳහා වැඩි පීඩනයක් යෙදීමට අසමත් වීම සම්බන්ධව ජාත්‍යන්තර මාධ්‍ය දැනටමත් චීනය විවේචනය කරනු ලබයි. බුරුමය මත වැඩි පීඩනයක් යෙදීමට චීන ආන්ඩුව තල්ලු කිරීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය ලේකම් රයිස් මේ සතියේ බෙයිජිනයේ තම සමපාර්ශවයාව දුරකථනයෙන් ඇමතී ය. බුරුමයට මැදිහත් වීම සඳහා එක්සත් ජාතීන්ගේ යෝජනාවක් සඳහා බලකිරීමට බුෂ් පරිපාලනය තීන්දු කර තිබුනා නම් බෙයිජිනය අපවාදයේ ඍජු ඉලක්කයක්

බවට ඉක්මනින්ම පත්වනු ඇත. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල සුළි සුලං ව්‍යසනය කථා කිරීමේ කවර හෝ උත්සාහයකට චීනය විරුද්ධත්වය ප්‍රකාශ කර තිබේ.

බුරුම ජුන්ටාව කෙරෙහි වොෂින්ටනයේ විරුද්ධත්වය පිටුපසින් පුලුල් ආර්ථික න්‍යාය පත්‍රයක් ද තිබේ. බුරුමය, ඇමරිකානු සංගතවලට ලාභ ශ්‍රමය මෙන්ම සහ තෙල් සහ ගෑස් ඇතුලු තීරනාත්මක සම්පත් සඳහා නව බලගතු මූලයකි. චෙව්රොන් තෙල් සංගතයට එහි බහු මිලියන ඩොලර් ආයෝජන බුරුමය තුල පවත්වා ගෙන යාම සඳහා එක්සත් ජනපද පරිපාලනය නිහඬව අවසර දී ඇති නමුත් එවන් මෙහෙයුම්වලට රටවල් දෙක අතර අයහපත් සම්බන්ධතා මගින් අවහිරතා පමුනුවනු ලැබ ඇත. ඉරානය සහ ඇෆ්ගනිස්ථානය තුල දී ක්‍රියාත්මක වන ආකාරයට වඩා වෙනස් ආකාරයකට බුරුමය තුල මානුෂික උත්සුකතාවයන් සම්බන්ධයෙන් බුෂ් පරිපාලනය ක්‍රියා කරනු නොලබයි. ධවල මන්දිරයේ මෑතම බොරු සහ කුහකකම් ප්‍රතික්ෂේප කිරීමේදී ඒ හා සම්බන්ධ මූලික ප්‍රශ්න කෙරහි සැලකිල්ල යොමු කිරීමට අත්‍යවශ්‍යය ය. ලෝක ජනයාගේ වඩාත් පීඩිත ස්ථරවලට යලි යලිත් එවන් ව්‍යසනයන්ගෙන් පහර එල්ල කෙරෙන්නේ ඇයි? ආසියාවේ, අප්‍රිකාවේ සහ ලතින් ඇමරිකාවේ මහජනතාවන් රෝග, කුසගින්න සහ දරිද්‍රතාව විසින් අඛන්ඩව විනාශයට ඇද හෙලනු ලබන්නේ ඇයි?

නර්ගිස් සුළි සුලඟ වැනි ස්වාභාවික ව්‍යසනයන්ගේ බලපෑම අවම කිරීමට මෙන්ම දුක්වේදනාවන් සහ දුප්පත්කම අහෝසි කිරීමට අවශ්‍යතරම් සම්පත් තිබේ. පසුගිය දශක තුන තුල නිෂ්පාදනයේ භූගෝලීකරනය තාර්කික සැලසුම්කරනයන් සඳහා පදනම තහවුරු කිරීමට සහ මිහිතලයේ සෑම කොටසකම මහජනතාව සඳහා යහපත් ජීවන තත්වයක් සහතික කිරීමට ලෝක පරිමානව සම්පත් බෙදා හැරීමේ මනුෂ්‍ය වර්ගයාගේ ආර්ථික ධාරිතාවයේ දැවැන්ත ප්‍රසාරනයක් සිදු වී ඇත. එහෙත් ධනවාදය යටතේ ප්‍රධාන කාර්මික රටවල් ඇතුලුව බහුතරයක් ජනයා දෛනිකව දිවි රැක ගැනීම සඳහා පොරබදන අතර මෙම දැවැන්ත විද්‍යාත්මක සහ ආර්ථික ධාරිතාව අතලොස්සක් ධනවතුන්ට ලාබ සම්පාදනය කිරීම සඳහා ගසා කනු ලබයි.

දරිද්‍රතාවය සහ විරැකියාව නොමග යෑමේ ප්‍රතිවිපාකයන් නොවේ. ලෝකයේ නාගරික සහ ගැමි දුප්පතුන්ගේ සුවිශාල ස්ථරය ගෝලීය ධනවාදයේ අත්‍යවශ්‍ය අංගයකි. ජාත්‍යන්තර කම්කරු පන්තියේ වැටුප් සහ සේවා කොන්දේසි මත නිරන්තර පීඩනයක් යෙදීම සඳහා ඔවුහු ශ්‍රම හමුදාවේ දැවැන්ත සංචිතයක් නිර්මානය කරති. දුප්පතුන් සහ පොහොසතුන් අතර දැවැන්ත සහ ගැඹුරුවන අගාධය අහෝසි කිරීමේ එකම මාධ්‍යය වන්නේ සමාජවාදී පිලිවෙත් මත සමාජය විප්ලවවාදී ලෙස ප්‍රතිව්‍යුහකරනය කිරීම ය. එවිට අතලොස්සකගේ ලාබ අවශ්‍යතාවලට ඉහලින් මනුෂ්‍ය වර්ගයාගේ දැවැන්ත බහුතරයක දැවෙන උවමනාවන්ට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත.

© www.wsws.org